# සමස්ත ලංකා පාසල් සංගීත තරගය - 2025

**(2025 සැප්තැම්බර් මස 27සහ 28)**

**සියලුම නේවාසික පහසුකම් අපේක්ෂිත පාසල්වල විදුහල්පතිවරුන් සහ ගුරුභවතුන් වෙත,**

## නේවාසික වන පාසල් අනිවාර්යයෙන් පිළිපැදිය යුතු උපදෙස්.

01. නේවාසික පහසුකම් අපේක්ෂා කරන පාසල්වල එම අයදුම්පත විදුහල්පති විසින් අත්සන් කර 0718068245 දරන WhatsApp අංකයට 2025 සැප්තැම්බර් මස 23වන දින ප.ව.3.00ට පෙර එවිය යුතු ය.

02. ඔබ වෙත වෙන් කර ඇති නේවාසික මධ්‍යස්ථානය වෙත වාර්තා කිරිම ප.ව. 6.00 ට පෙර සිදු කළ යුතු අතර නේවාසික ස්ථානයට වාර්තා කල වහාම දූරකථන අංක 0718068245 මගින් මෙම තරගයේ පාසල්වල නේවාසික කටයුතු සම්බන්ධීකාරක ඒ. ජී. ආර්. පද්මිණී මහත්මිය අමතා ඒ බව දැනුම් දී අදාළ නේවාසික මධ්‍යස්ථානය ලෙස ලැබෙන පාසලේ තොරතුරු දැනගත යුතු වේ.

03. නේවාසික මධ්‍යස්ථානයේ ඇති අත්සන් ලේඛනයෙහි පැමිණීමේ සහ පිටවීමට නියමිත වේලාව යොදා අත්සන් තැබීම අනිවාර්යයෙන්ම සිදු කළ යුතු ය.

04. විදුහල්පති අත්සනින් යුතුව සකසා ගෙන පැමිණි නේවාසික අයදුම්පතෙහි මුල් පිටපත ඔබගේ නේවාසික මධ්‍යස්ථානය වෙත භාරදීම අනිවාර්ය ය.

05. නේවාසික සිසුවියන් සඳහා ගුරු මහත්මීන්ගේ සහභාගීත්වයත්, සිසුන් සඳහා ගුරු මහතුන්ගේ සහභාගීත්වයත් අනිවාර්ය වේ. (මිශ්‍ර පාසලක සිසුන් පැමිණීමේ දී සිසුන්ට සහ සිසුවියන්ට වෙන වෙනම පාසල් ලබා දීම සිදු කෙරේ.)

06. සංවරශිලීබව සහ විනයගරුකබව රැක ගනිමින් තම පාසලේ ගරුත්වයට හානි නොවන ලෙස සහ නේවාසිකවන අනෙකුත් පාසල්වලට බාධාවක් නොවන සේ කටයුතු කිරීමට වග බලා ගත යුතු ය.

07. පාසලට සම්බන්ධ නැති බාහිර පුද්ගලයින් හට නේවාසිකාගාරයෙහි නේවාසික පහසුකම් ලබා දෙනු නොලැබේ.

08. නේවාසික වීමේ දී අවශ්‍ය දෑ ඔබ විසින්ම සපයා ගත යුතු ය.

09. වැසිකිළි, කැසිකිළි භාවිතා කිරීමේ දී එහි පවිත්‍රතාව රැකීමට කාරුණික වන්න.

10. ජලය සහ විදුලිය අපතේ යැවීමෙන් වළකින්න.

11. <u>ඔබ භාවිතා කරන පන්ති කාමර පිරිසිදු කර යාම අනිවාර්යයෙන්ම සිදු කළ යුතු අතර ඉවත් කරන කැළි කසල, කසල බහාලුම්වල අසුරා මධ්‍යස්ථාන භාර නිලධාරීතුමා සහ කාර්ය මණ්ඩලය ලබාදෙන උපදෙස් අනුව බැහැර කළ යුතු ය.</u>

12. නේවාසික පහසුකම් සපයන පාසල් අපිරිසිදු කරමින් කටයුතු නොකිරීමට සිසු සිසුවියන්ට උපදෙස් ලබා දීම අදාළ කණ්ඩායම් භාර ගුරුභවතාගේ වගකීමක් වන අතර අලාභ හානියක් සිදු වුවහොත් ඊට ඔබ වග කිව යුතු වේ.

වරුණ අලහකෝන්
අධ්‍යාපන අධ්‍යක්ෂ (සෞන්දර්ය අධ්‍යාපන)
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය
අධ්‍යාපන අමාත්‍යාංශය
''ඉසුරුපාය'', බත්තරමුල්ල.

වරුණ අලහකෝන්
අධ්‍යාපන අධ්‍යක්ෂ
සෞන්දර්ය අධ්‍යාපන